# 8 ශ්‍රේණිය

# සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය

## ඒකකය 17

# පාරිසරික අභියෝග වලට සාර්ථකව මුහුණ දෙමු







ඩබ්ලිව්. ඒ. ඩී. නීල් චන්දන.
ඇල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය.

# ❑ පාරිසරික අභියෝග යනු,

- එදිනෙදා ජීවිතයේ අපට මුහුණ දීමට සිදුවන අභියෝග පාරිසරික අභියෝග ලෙස හැඳින්විය හැක.

## වර්ගීකරණය

- රෝගාබාධ
- අනතුරු
- ආපදා
- මත්ද්‍රව්‍ය
- අපචාර හා අපයෝජන

# අනතුරු








- අනතුරැක් ඕනෑම ස්ථානයකදී ඕනෑම පුද්ගලයකුට සිදුවිය හැක.

| ස්ථානය | අනතුරේ ස්වභාවය හා හානිදායක තත්ව |
|---|---|
| නිවස | අත් කැපීම නිසා තුවාල සිදුවීම, අධික රුධිර වහනය. |
| කම්හල් | හානිකර රසායනික ද්‍රව්‍ය නිසා පරිසර දූෂණය, රෝගාබාධ. |
| පාසල | අවිවේකිබව නිසා මානසික පීඩා හා කලන්තය. |
| ක්‍රීඩා පිටිය | වැටීම,පන්දුවක් වැදීම නිසා තැලීම් කැඩුම් බිදුම් හා උළුක්කුවීම්. |
| ඉදිකිරීමේ ස්ථාන | ඉහළ ස්ථානයකින් වැටීම, විදුලි සැරවැදීම නිසා ජීවිත හානි, කැඩුම් බිදුම්. |
| ජලාශ | දියේ ගිලීම නිසා ජීවිත හානි. |
| මහා මාර්ගය | වාහන හා පදික අනතුරු නිසා බරපතළ තුවාල හා ජීවිත හානි. |





## ❖ අනතුරු වළක්වා ගමු,









- ❑ විය හැකි අනතුරු පිළිබඳව දැනුමෙන් අවබෝධයෙන් කටයුතු කිරීම.






- ❑ සෑම විටම වැඩිහිටි උපදෙස් මත ක්‍රියා කිරීම.
- ❑ සෑම අවස්ථාවකම ආරක්ෂිත උපකරණ භාවිතය.
- ❑ අවදානම් සහිත ක්‍රියාවල නිරත නොවීම.
- ❑ තමන් පරිහරණය කරන දෑ නියමිත ස්ථානවල තැබීම.
- ❑ ක්‍රීඩාවේ හා සමාජයේ නීති රීති පිළිපැදීම.



# ආපදා





## ආපදා පළිබදව අපි වගුවකින් පැහැදිළි කර ගනිමු.

| ආපදා තත්වය | ස්වරූපය | අප රටට බලපෑම | හානිකර තත්වය |
|---|---|---|---|
| 01. ගංවතුර | ස්වභාවික | වසරකට වතාවක් පමණ සිදුවේ. | දේපල හානි හා ජීවිත හානි බෝවන, රෝග ව්‍යාප්තිය. |
| 02. නියඟය | ස්වභාවික | වසර කීපයකට වතාවක් පමණ සිදුවේ. | වගා හානි, ජලය නොමැති වීම, වන සතුන් මියයාම, ආර්ථික අපහසුතා |
| 03. නායයෑම | ස්වභාවික හා මිනිස් ක්‍රියාකාරකම් | වසරකට වතාවක් පමණ සිදුවේ. | දේපල හානි හා ජීවිත හානි වගා හානි, |
| 04. සුනාමි | ස්වභාවික | සියවස් ගණනකට පසු 2004 දෙසැම්බර් 26 අප රටට බලපෑමක් ඇති වුවත් ජපානයට නිරන්තරව ඇතිවන තත්වයකි. | දේපල හානි හා ජීවිත හානි, රටක ආර්ථිකයට සිදුවන හානි. |

# ආපදා







## ආපදා පළිබදව අපි වගුවකින් පැහැදිළි කර ගනිමු.

| ආපදා තත්වය | ස්වරූපය | අප රටට බලපෑම | හානිකර තත්වය |
|---|---|---|---|
| 05. යුදමය තත්වයන් | මිනිස් ක්‍රියාකාරකම් | 1983 කාලයේ සිට 2008 දක්වා පැවතීම හා 2019 අප්‍රේල් 21 ත්‍රස්ත ප්‍රහාරය. | දේපල හානි හා ජීවිත හානි, රටක ආර්ථිකයට සිදුවන හානි.රටේ පැවැත්මට පුද්ගල මනසට සිදුවන හානි . |
| 06. වසංගත රෝග | ස්වභාවික හා මිනිස් ක්‍රියාකාරකම් | දැනට ලොවෙහි පවතින "කෝවිඩ් 19" රෝග තත්වය. | ජීවිත හානි, රටක ආර්ථිකයට සිදුවන හානි.රටේ පැවැත්මට පුද්ගල මනසට සිදුවන හානි. රටෙහි අධ්‍යාපනයට සිදුවන හානිය. |
| 07. ගුවන් හා නාවික අනතුරු | මිනිස් ක්‍රියාකාරකම් | පසුගිය කෙටිකාලයක් තුළ අප රටේ මුහුදු සිමාවේ නැව් ගිනිගැනීම් සිදුවීම. | රසායනික ද්‍රව්‍ය හා තෙල් සාගරයට එකතු වීම නිසා මුහුදුජීවින්ට වෙරළ තීරයට වු දැඩි බලපෑම |
| 08. සතුන්ගෙන් සිදුවන අපදා | ස්වභාවික හා මිනිස් ක්‍රියාකාරකම් | පසුගිය කාල වකවානුවේ අලින්ගෙන් සිදුවූ අපදාවල වර්ධනයක් පෙනේ. | දේපල හානි හා ජීවිත හානි, වගා හානි,ජන ජීවිතයට සිදුවන බලපෑම |



# අපචාර හා අපයෝජන.




**අපචාර යනු, සමාජ විරෝධි ක්‍රියාවල යෙදීම වන අතර ඒ සදහා පොළඹවා ගැනීම අපයෝජනයයි.**





එවැනි අවස්ථාවන් පිළිබදව අපි දැණුවත් වෙමු.

- ළමුන් රැවටීම.
- ශාරීරිකව හා මානසිකව වද හිංසා පැමිණවීම.
- සමාජයේ ලජ්ජාවට පත්කිරීම.
- බිය වැද්දීම.
- ළමා මෙහෙකාර සේවයේ යෙදවීම.
- බලහත්කාරයෙන් හෝ මුළා කිරීමෙන් ලිංගික අතවර වලට ගොදුරු කර ගැනීම.
- ළමුන් අනිසි දේ පරිහරණයට හා ප්‍රවාහනයට යොදවාගැනීම.









# අපචාර හා අපයෝජන වලින් වැලකී අපි දැණුවත්ව කටයුතු කරන ආකාරය පිළිබද සොයා බලමු.




- සමාජ විරෝධී ක්‍රියාවන් පළිබද අවබෝධ කරගැනීම.
- වැඩිහිටියන්ගේ අනිසි හැසිරීම් පිළිබඳ අවදානයෙන් සිටීම.
- අනවශ්‍යය තෑගි බෝග ලබාගැනීමෙන් වැලකී සිටීම.
- නිතරම විශ්වාසවන්ත වැඩිහිටියෙකුගේ සහය පැතීම.
- ඔබට අතවරයක් සිදුවීමට යන බව හැගුනොත් උපකාර ඉල්ලා කෑගැසීම හා ආරක්ෂිත ස්ථානයකට යාම.
- තමන්ගේ ශරීරය සුවිශේෂී බැවින් වෙනත් අයෙකුට පෞද්ගලික ස්ථාන ස්පර්ශ කිරීමට ඉඩ නොදීම .
- ඇදුම් පැළදුම්, කතාබහ සංවරව පවත්වාගෙන යාම.
- වැඩිහිටියන් නිවසේ නොසිටින අතරතුර යහළුවන්, පිටස්තර පුද්ගලයන් නිවසට ගෙන්වා ගැනිමෙන් වැලකීම.
- අන්තර්ජාල, වෙබ් අඩවි , ජංගම දුරකථන වැඩිහිටියන්ගේ අනුදැනුම ඇතිව භාවිත කිරීම.
- රැකවරණය අවශ්‍ය වයසක සිටිනබව නිතර සිහියේ තබාගැනීම හා කාලීන සමාජ මිනිස් ක්‍රියාකාරකම් පිළිබද නිතර දැණුවත් වීම.

# මත්ද්‍රව්‍ය

" මද්‍යසාර, දුම්වැටි හා අනෙකුත් සියලු මත් වන ද්‍රව්‍ය මත්ද්‍රව්‍ය ලෙස සැලකේ "



- මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන හානි පිළිබඳ සොයා බලමු.

**කායික**

- සමාන්‍ය ශාරීරික ක්‍රියාකාරිත්වය අඩපන වීම.
- මානසික විකෘතිතා ඇතිවීම.
- අවලස්සන වීම හා විවිධ රෝගවලට ගොදුරුවීම.
- ස්නායු දුර්වලතා, ආයුෂ අඩු වීම හා ජීවිත හානි සිදුවීම



**මානසික හා සමාජීය**

- ආර්ථික ගැටළු හා පවුල් ආරවුල් ඇතිවීම.
- සමාජ විරෝධී ක්‍රියා සඳහා යොමුවීම.
- අපචාර හා අපයෝජන සඳහා පෙලඹීම
- සමාජයේ කොන්වූ පුද්ගලයෙක් බවට පත්වීම.
- නිතර ගැටළු හා ගැටුම්කාරී තත්ත්ව ඇතිවීම.





# රෝගාබාධ



## බෝනොවන රෝග

- හෘද රෝග
- අධික රුධිර පීඩනය
- දියවැඩියාව
- පිළිකා
- වකුගඩු රෝග
- ස්නායු රෝග





## බෝවන රෝග

- කොවිඩ් 19 වෛරස් රෝගය
- සරම්ප
- පැපොල
- කම්මුල්ගාය
- චිකුන් ගුන්යා
- සහස්
- H I V වැනි ලිංගික සම්ප්‍රේෂණ රෝග



**බෝනොවන රෝග සෑම වයස් සීමාවකම අයට වැළදීමේ ප්‍රවනතාවයක් වර්තමානයේ දක්නට ලැබේ.**

**එවැනි ප්‍රවනතාවයක් ඇතිවීමට හේතු සොයා බලමු.**




- වැරදි ආහාර රටාවන් - අධික සිනි ,තෙල්, ලුණු සහිත ආහාර ගැනීම හා
- ජලය අඩුවෙන් පානය කිරීම - අවම පනිය ජල මට්ටම වන මි.ලි ලීටර් 1500 වඩා අඩුවෙන් ගැනීම
- වගාවන් සදහා රසායනික ද්‍රව්‍ය හා පොහොර භාවිතය.- වකුගඩු ආශ්‍රිත රෝග වර්ධනය
- ශාරීරික ව්‍යායාම නොමැති වීම. - හෘද රෝග , අධික රුධිර පීඩනය , දියවැඩියාව , පිලිකා
- මානසික ආතතිය නිතර ඇතිවීම - හෘද රෝග , අධික රුධිර පීඩනය , දියවැඩියාව
- මත්ද්‍රව්‍ය භවිතය - හෘද රෝග , අධික රුධිර පීඩනය , දියවැඩියාව , පිලිකා


